# 23 දිව්‍ය පූජාව

යමු යමු යමු අපි මැදුරට සමිඳුන්
පැවසූ සඳ ඔහු මා අමතා
මගේ හිසින් ගත් ඔවුන්ගෙ එබසින්
මගෙ හදවත පිපුණා
මගෙ හදවත පිපුණා

අපි දැන් එහි වමු ඔබ පා සෙවණේ
ඔබගේ වාසල් දෙරටු තුළේ

සැරදේ ජෙරුසලමේ
සැරදේ ජෙරුසලමේ

(කිතුනු ගී අංක 5)

**මෙනෙහි කර බලන්න**

1. මෙම ගීතිකාව තුළින් කුමක් කිරීමට ඔබට ආරාධනා කරන්නේ ද?
2. කවර අවස්ථාවක දී මෙම ගීතිකාව ගායනා කිරීම වඩාත් සුදුසු වන්නේ ද?
3 ශුද්ධ බයිබලයේ ගීතාවලියේ 122වන ගීතය කියවා මෙනෙහි කරන්න.
4. ගීතාවලිය 122වන ගීතයෙන් ඔබට ලැබෙන පණිවිඩය කුමක් ද?

කතෝලික අපට දිව්‍ය පූජාව තරම් වරප්‍රසාද ගලා එන උල්පතක් තවත් නැත. දේව වන්දනාවේ උතුම් ම පිළිවෙත දිව්‍ය පූජාව යි. එබැවින් එහි ශුද්ධත්වය, ගරුත්වය, නිරවද්‍ය බව, ගාම්භීර බව යනාදිය සුරැකීමට අපි බැඳී සිටිමු.

දිව්‍ය පූජාව තුළ ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස පූර්ණ වශයෙන් සමරයි. සෑම ඉරුදිනක ම හා ණය මංගල්‍ය දිනක ම නොවරදවා ම දිව්‍ය පූජාවට සහභාගි විය යුතු ය. පවුලක් ලෙස මුළු දිව්‍ය පූජාවට ම සහභාගි වීම වැදගත් වේ.

දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 2කි.

1. දේව වාක්‍යය පිළිවෙත
2. ස්තෝත්‍ර යාගික පිළිවෙත

# දිව්‍ය පූජාවේ පිළිවෙත්

1. ආරම්භක පිළිවෙත
2. දේව වාක්‍යය පිළිවෙත
3. පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත
4. ස්තෝත්‍ර යාගික පිළිවෙත
5. ධර්මදූත කාර්ය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත

## 1. ආරම්භක පිළිවෙත

i. ඇතුළුවීමේ ගීතිකාව
ii. ආචාරය
iii. හැඳින්වීම
iv. පශ්චත්තාපිත පිළිවෙත
v ස්වාමිනී කරුණා කළ මැනව
vi. සුරදූත ගීය
vii. පොදු යැදුම

### i. ඇතුළුවීමේ ගීතිකාව



23.1 රූපය - දිව්‍ය පූජාවේ ඇතුළුවීමේ පෙරහැර

දිව්‍ය පූජාව ආරම්භ වන්නේ, ඇතුළුවීමේ ගීතිකාවෙනි. එම අවස්ථාවේ දී ඇතුළුවීමේ පෙරහැර ගමන් කරයි. එයින් දේව ජනතාව වන්දනා ගමනක යෙදෙන බව සිහිපත් කරයි. සුවඳ දුම්, ශ්‍රී කුරුසිය, ශ්‍රී කුරුසියට දෙපසින් ඉටි පහන් ද රැගත් පූජා සහායකයෝ පෙරහැරේ ඉදිරියෙන් ම ගමන් කරති. අනතුරු ව දිව්‍ය පූජාවේ විවිධ මෙහෙවරයන් කරන අය



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සෙසු පූජා සහායකයන් හා ශ්‍රී සුබාරංචි පාඨ සංග්‍රහය රැගෙන යන්නා ද ගමන් කරති. ඊටත් පිටුපසින් මුලසුන හොබවන පියතුමා ගමන් කරයි. ඇතුළුවීමේ ගීතිකාව ගායනා කිරීමෙන් දේව ජනතාවගේ එකමුතුකම ප්‍රකාශ වේ. ඇතුළුවීමේ පෙරහැරට ගමන් කිරීමටත් ඇතැම් විට දේව වන්දනා වසරේ සැමරුම් හඳුන්වා දීමටත් ඇතුළුවීමේ ගීතිකාව ගායනා කරනු ලැබේ. පෙරහැරේ ගමන් කරන සියලු දෙනා පූජාසනය ඉදිරිපිට දණ නමා හෝ ගැඹුරු ශීර්ෂ ප්‍රණාමයෙන් ගෞරවාචාර දක්වනු ලැබේ.

දිව්‍ය පූජාව තුළ ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත:

1. නමස්කාරය
2. පූජාසනය සිපාචාරය
3. සුවඳ දුම්
4. දල්වන ලද පහන්

**ii. ආචාරය**

කුරුසියේ ලකුණින් පසු පියතුමා සැදැහැවතුන්ට ආචාර කරයි.

**iii. හැඳින්වීම**

එය දිව්‍ය පූජාවේ ධාර්මික ප්‍රවේශය ලබා දෙන අතර එදිනට ආවේනික සැමරුම වෙත ජනතාව යොමු කරවයි. දේව වන්දනා වසරේ කාලය, දේව වාක්‍ය පිළිවෙතේ තේමාව හා විශේෂ යමක් ඇත්නම් මෙහි දී ඉතා කෙටියෙන් ප්‍රකාශ කරයි.

**iv. පශ්චත්තාපිත පිළිවෙත**

පශ්චාත්තාපික පිළිවෙත තුන් ආකාරයකට කළ හැකි ය.

- පශ්චත්තාපිත යැදුම (සියලු බලැති දෙවියන් වහන්සේට ද.........)
- ක්‍රිස්තු කේන්ද්‍රීය ප්‍රාර්ථනාව (....ස්වාමීනි කරුණා කළ මැනව, ........)
- ආසිරි පැන් පිළිවෙත (පශ්චත්තාපික ගීයක් ගායනා කරන අතර තුර)

**v. ස්වාමිනී කරුණා කළ මැනව (කීරියේ)**

**vi. සුරදූත ගීය (ග්ලෝරියා)**

මංගල්‍යය හා ඉරිදා දිනවල දී මෙය ගායනා කෙරේ. චතාරික හා ආගමන කාලය තුළ සුරදූත ගීය ගායනා නොකර යි.

**vii පොදු යැදුම (ආරම්භක යැදුම)**

මුලසුනේ පළමු යැදුම මෙය යි. මෙය පොදු යැයි පවසන්නේ, ජනතාවගේ සියලු යැදුම් අදහස් එකතු කරන නිසා ය. සංඝයේ මූලිකයා ලෙස පියතුමා පොදු යැදුම දෙවියන් වහන්සේට ඔප්පු කරයි.

## 2. දේව වාක්‍යය පිළිවෙත



23.2 රූපය - සුවිශේෂ ප්‍රකාශය

දේව වාක්‍යය පිළිවෙතේ කොටස්

i. පළමු දේව ප්‍රකාශය ⟶ දේව වචනයට සවන් දෙමු
ii. පිළිතුරු ගීය ⟶ දේව වචනයෙන් පිළිතුරු දෙමු
iii දෙවන දේව ප්‍රකාශය ⟶ දේව වචනයට සවන් දෙමු
iv. සාධුකාරය ⟶ ක්‍රිස්තුන් වහන්සේ ව ප්‍රශංසනාත්මක ව පිළිගනිමු
v. සුබාරංචි ප්‍රකාශය ⟶ ක්‍රිස්තුන් වහන්සේ ට සවන් දෙමු
vi. ධර්මානුශාසනාව ⟶ දේව වචනය ජීවිතයට අදාළ කර ගනිමු
vii. විශ්වාස ලක්ෂණය ⟶ අපේ විශ්වාසය ප්‍රකාශ කරමු
viii. විශ්වාසකයින්ගේ යැදුම් ⟶ අවශ්‍යතා වෙනුවෙන් යදිමු

## 3. පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත



23.3 රූපය - පුදසුන සූදනම් කිරීම

මෙම පිළිවෙත ඇරඹෙන්නේ පඬුරු පෙරහැරෙනි. පඬුරු පිදීමේ පරමාර්ථ 3කි.

1. පූප සහ මිදියුස ගෙන ඒම
2. දුගී දුප්පත් අයට දිය හැකි පඬුරු ගෙන ඒම
3. ශුද්ධ වූ සභාවේ නඩත්තුව සඳහා පඬුරු පිදීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මුදල් සම්මාදම් පඬුරු පෙරහැරේ කොටසකි. පඬුරු පෙරහැරේ දී සංකේතාත්මක පඬුරු රැගෙන එන්නේ නැත. එය නිරර්ථක ය. රැගෙන එන පඬුරු කිසිසේත් ම විස්තර කරන්නේ ද නැත. ගෙනෙන පඬුරුවලින් පුදසුන මත තබන්නේ පූප සහ මිදියුස පමණි.

පුදසුන සුදානම් කිරීමේ පිළිවෙතට අයත් අනුකොටස් 2කි:

i. පඬුරු පෙරහැර හා පඬුරු පිදීම
ii. පඬුරු මත යැදුම

## 4. ස්තෝත්‍ර යාගික පිළිවෙත



23.4 රූපය - ස්තෝත්‍ර යාගික යැදුමේ දී

මෙම පිළිවෙතේ ප්‍රධාන කොටස් 3කි.

1. ස්තෝත්‍ර යාගික යැදුම
2. ස්වාමිවාක් ආරාධනාව, සාමය පැතීම හා පූප කැඩීම
3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම හා බොදුනෙන් පසු යැදුම

- ස්තෝත්‍ර යාගික යැදුම

  දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව මෙය යි. සම්පූර්ණයෙන් ම දෙවියන් වහන්සේ වෙත යොමු වන යාච්ඤාවකි. පුත්‍රයාණන් වහන්සේ මගින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ සහභාගීකමෙන් කෙරෙන යාච්ඤාවකි.

- ස්වාමිවාක් ආරාධනාව

  අති උතුම් පළමුවන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා විසින් මෙම යැදුම (ස්වාමිවාක් ආරාධනාව) ස්තෝත්‍ර යාගික පිළිවෙතේ වර්තමාන ස්ථානයට ගෙන එන ලදි.

- **සාමය පැතීම**

  ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ උත්ථානයෙන් පසු ව තම ශ්‍රාවකයන්ට දර්ශනය වී උත්ථානයේ සදාතනික සාමය ප්‍රාර්ථනා කළ සේක. අපි එකිනෙකා ප්‍රාර්ථනා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ බලමහිමයෙන් පරිසමාප්ත වූ සාමය යි.

- **පූප කැඩීම**

  පූප කැඩීමෙන් සංකේතවත් කරන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේ ව ම කඩා බෙදා දුන් බව යි.

- **දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය**



23.5 රූපය - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම

දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය අනුභව කිරීම නිසා එක ම සංඝයක, පවුලක සාමාජිකයන් බවට පත්වෙයි. යුගාන්තයේ මහා මංගල භෝජනයට මෙය පෙරහුරුවක් ලෙස ද සලකනු ලබයි. මෙම භෝජනය විශ්ව කතෝලික සභාව සමග සහභාගිකමේ සංකේතයක් සනිටුහන් කරයි.

## 5. ධර්මදූත කාර්ය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත

අවසාන ආශිර්වාදයෙන් අප ව පිටත් කර යවන්නේ ධර්මදූත ක්‍රියාවලියකට ය. දේව වචනයට සවන් දී, ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් පෝෂණය වී, ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයට සාංඝික වූ අපි, පිටත් ව යන්නේ, ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ පණිවුඩය අපගේ එදිනෙදා ජීවිතය තුළ ජීවත් කරන්නට ය.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

දිව්‍ය පුජාවේ දී දක්නට ලැබෙන **මුලසුනේ යැදුම්** 3කි.

1. පොදු යැදුම
2. පඬුරු මත යැදුම
3. බොදුනෙන් පසු යැදුම

## ක්‍රියාකාරකම

1. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් **දෙක** කවරේ ද?
2. දිව්‍ය පූජාවේ පිළිවෙත් නම් කරන්න.
3. ආරම්භක පිළිවෙතේ අනු කොටස් නම් කරන්න.
4. දිව්‍ය පූජාවේ ප්‍රධානතම යාච්ඤාව කුමක් ද ?
5. දිව්‍ය පූජාවේ පහත දක්වා ඇති අවස්ථාවල දී යොදා ගත හැකි ගීතිකා **දෙක** බැගින් සඳහන් කරන්න.
   අ) ඇතුළුවීමේ පෙරහැර
   ආ) පඬුරු පෙරහැර
   ඇ) දිව්‍ය භෝජනය අනුභව කිරීමේ දී
   ඈ) දිව්‍ය පූජාව අවසානයේ දී
6. පහත සඳහන් මාතෘකා යටතේ විශ්වාසකයින්ගේ යාච්ඤාව බැගින් නිර්මාණය කරන්න.
   (i) සාන්ත සභාවේ අවශ්‍යතා උදෙසා
   (ii) ලෝකයේ ගැලවීම හා ජන නායකයින් උදෙසා
   (iii) පීඩිත අය උදෙසා
   (iv) මීසමේ සැදැහැවත් ජනතාව උදෙසා
7. දිව්‍ය පූජා මෙහෙය අර්ථවත් කර ගැනීම සඳහා ඔබට කළ හැකි යෝජනා **පහක්** සඳහන් කරන්න.



***ජීවිතය සඳහා***

***නිසි සූදානමකින් හා බැති සිතින් දිව්‍ය පූජාවට සහභාගී වෙමු; දෙවියන් වහන්සේ ව මුණ ගැසෙමු. සුවය, සැනසුම, සතුට හා සාමය අත්දකිමු.***